# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | | | |
|---|---|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | | | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk | ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1385 / 2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 திகதி | දිනය<br>Date | 05/11/2023<br>පැය 1550 |

# මාධ්‍ය නිවේදනය

## 01. දියේ ගිලීමක් - හබරාදුව පොලිස් වසම.

2023.11.04 වන දින සවස් කාලයේදී හබරාදුව පොලිස් වසමේ මිහිරිපැන්න ප්‍රදේශයේදී මුහුදේ දිය නාමින් සිටි පිරිසක් දියේ ගසාගෙන ගොස් ඇති බවට හබරාදුව පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත. පොලිස් ස්ථානයේ නිලධාරීන් සහ ප්‍රදේශවාසීන් එක්ව තිදෙනෙකු බේරාගෙන ඇත. එක් පුද්ගලයෙකු දියේ ගිලී සිටියදී ගොඩට ගෙන කරාපිටිය රෝහලට ඇතුලත් කර ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇති අතර තවත්පුද්ගලයෙකු දියේ ගිලී අතුරුදහන්ව ඇත.

**මරණකරු වයස අවුරුදු 27 ක් වන කටුපොල්වත්ත, වලහන්දුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. අතුරුදහන්වූ අය වයස අවුරුදු 24 ක් වන නියාගම, අක්මීමන ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය කරාපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇත. අතුරුදහන්වූ අය සෙවීමේ කටයුතු නාවික හමුදාව විසින් සිදුකරගෙන යනු ලබයි. හබරාදුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

## 02. පුද්ගල මළසිරුරක් හමුවීමක් - වැල්ලවත්ත පොලිස් වසම.

2023.11.05 වන දින උදෑසන කාලයේදී වැල්ලවත්ත පොලිස් වසමේ මුහුදු මාවතේ පිහිටි අවන්හලක් ඉදිරිපිට මුහුදු තිරයට පුද්ගල මළසිරුරක් ගොඩ ගසා ඇති බවට වැල්ලවත්ත පොලිස් ස්ථානයට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**මරණකරු වයස අවුරුදු 28 ක් වන තාවඩි, මනිප්පායි පාර ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය සම්බන්ධයෙන් මහේස්ත්‍රාත් පරීක්ෂණය සිදුකිරීමෙන් අනතුරුව පශ්චාත් මරණ පරීක්ෂණය සඳහා මෘත ශරීරය කළුබෝවිල රෝහලට රැගෙනගොස් ඇත. වැල්ලවත්ත පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකර ගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**